# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2123/73 - 2019 මැයි මස 17 වැනි සිකුරාදා - 2019.05.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

2019 අංක ........ දරන බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය

2019 අංක ......... දරන බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්ති කෙටුම්පත සඳහා බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය, අමාත්‍ය මණ්ඩල තීරණ අංක. VI/118/04-2018-02 (i) හා 2018.04.25 දිනැතිව ලැබී ඇති බවත් එය බස්නාහිර පළාත් සභාවේ අනුමැතිය සඳහා මවිසින් යෝජනා කරන්නට නියමිත බවත් මහජනයාගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,<br>
ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන, ආර්ථික ප්‍රවර්ධන,<br>
විදුලිබල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා<br>
ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය.<br>
බස්නාහිර පළාත.

2019 අප්‍රේල් මස 18 වැනි දින දී ය.

**2019 අංක ............ දරන බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය**

බස්නාහිර පළාත ඇතුළත කෘෂිකාර්මික, කාර්මික, වානිජ්‍ය හා වෙළඳ ව්‍යවසාය සහ වෙනත් ආදායම් උපදින ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම, පිහිටුවීම හා ඒවායේ නිරතවීම සඳහා ද, කාර්මික හා ආර්ථික සංවර්ධන සැලසුම් සකස් කිරීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම සඳහා ද, විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම සඳහා ද, බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයක් පිහිටුවීම පිණිසද, බස්නාහිර පළාතේ 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

01. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 2019 අංක ........... දරන බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය. *ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය*



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## *I* කොටස

### බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය පිහිටුවීම

ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය පිහිටුවීම.

2\. (1) මෙහි මින්මතු ''කාර්යාංශය'' යනුවෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාත් ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය මෙයින් සංස්ථාපනය කරනු ලැබේ.

(2) කාර්යාංශය (1) උපවගන්තිය අනුව නියමිත නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති, නඩුපැවරීමට හා නඩු පවරනු ලැබිය හැකි සංස්ථාපිත ආයතනයක් වන්නේ ය.

## *II* කොටස

### කාර්යාංශයේ අරමුණු හා බලතල

කාර්යාංශයේ අරමුණු

3\. කාර්යාංශයේ අරමුණු පහත පරිදි වේ.

(1) පළාතේ ආර්ථික හා සමාජ යටිතල පහසුකම් සංවර්ධනය හා පුළුල් කිරීම, නිෂ්පාදන ප්‍රවර්ධනයට දායකවීම සහ සියළුම සේවාවන් සැපයීම, රැකිරක්ෂා සම්පාදනයට අනුබල දීම සහ වැඩිදියුණු කිරීමට සහායවීම.

(2) ව්‍යවස්ථාවෙන් බලය දී ඇති ප්‍රමාණයට විදේශීය ආයෝජකයන් පළාතේ සංවර්ධනය සඳහා දායක කර ගැනීමට අවශ්‍ය ක්‍රම උපායන් සකස් කිරීම සහ දේශීය ආයෝජන දිරිමත් කිරීම.

(3) ආයෝජන දිරිමත් කිරීමට යෝග්‍ය පහසුකම් සහ ආයෝජනයට හිතකර වාතාවරණයක් සකස් කිරීම.

(4) පළාතේ දළ දේශීය නිෂ්පාදනය ඉහළ නැංවීමට සහ ආදායම් ඉහළ නැංවීමට ඉවහල් වන ව්‍යාපෘති හඳුනා ගැනීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ විෂයභාර පළාත් අමාත්‍යාංශය වෙත සහාය ලබා දීම.

(5) ආර්ථික ප්‍රවර්ධන සම්බන්ධයෙන් උපදේශන සේවා පවත්වාගෙන යාම හා සැපයීම.

(6) ආර්ථික ප්‍රවර්ධනයට අදාළ පර්යේෂණ සහ පුහුණු කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කිරීම හා පර්යේෂණ කටයුතු පවත්වාගෙන යාම.

(7) පළාත තුළ පළාත් සභාව උදෙසා ආදායම් උපදින ව්‍යාපෘති පිහිටුවීම, ප්‍රවර්ධනය හා ඒවායේ නිරතවීම.

(8) අවශ්‍ය අවස්ථාවලදී පෞද්ගලික අංශය සමග ඒකාබද්ධව ව්‍යවසාය ව්‍යාපෘති ආරම්භ කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

කාර්යාංශයේ බලතල

4\. කාර්යාංශයේ බලතල පහත පරිදි වේ.

(1) යම් චංචල හෝ නිශ්චල දේපලක් මිලදී ගැනීම, බද්දට ගැනීම හෝ අත්පත් කර ගැනීම, දැරීම අන්‍යාකාරයකින් කාර්යාංශය නමින් බැහැර කරන දේපලක් දැරීම සහ පවරන ලද සාධන පත්‍රයේ කොන්දේසි වලට යටත්ව විකිණීම, බදු දීම හෝ උකස් කිරීම.

(2) කාර්යාංශයේ මුදල්වලින් මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයන්, පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය ඇතිව සුදුසු යැයි කාර්යාංශය සලකන, සුරැකුම්පත් හෝ තැන්පතු විෂයෙහි ආයෝජනය කිරීම.

(3) කාර්යාංශයේ අරමුණු වලට අදාළ කවර වූ හෝ කරුණක් සම්බන්ධයෙන් වෙනත් පාර්ශව සමග ගිවිසුම්වලට හෝ කොන්ත්‍රාත්වලට එළඹීම සහ ඒවා ඉටු කිරීම.

(4) කාර්යාංශයේ නිලධරයන්, සේවකයන් පත්කිරීම, මාරු කිරීම හා සේවය අවසන් කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ විනය පාලනය සම්බන්ධයෙන් අදාළ වන කාර්ය පටිපාටි සහ සේවා ව්‍යවස්ථාවන් නියම කිරීම.

(5) පළාත් භාණ්ඩාගාරයේ අනුමැතිය සහ ජාතික හා පළාත් සභා ප්‍රතිපත්ති වලට අනුකූලව තාක්ෂණය, විශේෂඥ ඥාණය හෝ වෙනත් ආධාර ලබා ගැනීම.

(6) විෂයභාර අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව ණය ලබා ගැනීම.

(7) මෙම ප්‍රඥප්තියේ අරමුණු සඳහා වෙනත් පාර්ශවයන් සමග සමාගම් පිහිටුවීම.

(8) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් අරමුණු යටතට ගැනිය හැකි කවර හෝ කරුණක් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සියලු බලතල.

## *III* වන කොටස

### කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය

කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලය

5. අධිකාරියේ සියලු පරිපාලන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා මෙහි මින්මතු ''මණ්ඩලය'' යනුවෙන් හඳුන්වනු ලබන කළමනාකරණ මණ්ඩලයක් වන්නේ ය. කළමනාකරණ මණ්ඩලය පහත සාමාජිකයින්ගෙන් සමන්විත විය යුතු ය.

නිලබලයෙන් පත්වන සාමාජිකයින්

(1) නිලබලයෙන් පත්වන සාමාජිකයන් ;

(අ) පළාතේ ප්‍රධාන ලේකම් නම් කරනු ලබන තැනැත්තෙකු ;
(ආ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය) ;
(ඇ) නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (සැලසුම්) සහ

පත්කළ සාමාජිකයින්

(2) කෘෂිකාර්මික, කාර්මික, වානිජ්‍ය හා වෙළඳ ව්‍යවසාය, නීතිය යන ක්ෂේත්‍රයන්ගෙන් නියෝජනය වන පරිදි සැලසුම් සම්පාදනය, රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල ආයෝජන කටයුතු, විදේශ ආධාර ආයතන සමගා කටයුතු කිරීමේ හැකියාව හා පළපුරුද්දක් හා දැනුම ඇති අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නියෝජිතයන් හතර දෙනෙක්.

(3) පත්කළ සාමාජිකයින් අතරින් එක් අයෙකු අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපති වශයෙන් පත් කළ යුතු ය.

(4) ඉහත (1) හා (2) උපවගන්ති වල සඳහන් පත් කිරීම් සම්බන්ධයෙන් වන පත්වීම් ලිපි ආමාත්‍යවරයා විසින් නිකුත් කළ යුත්තේ ය.

සාමාජිකයෙකු වීමට නුසුදුසුකම්

6. යම් තැනැත්තෙකු,

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ,
(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන්නේ නම් හෝ,
(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තෙක් බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම් හෝ,
(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දන්ඩන නියමයකට යටත්ව සිටීනම් හෝ සිටියේ නම් හෝ,
(ඉ) අධිකරණයක් විසින් වස්තුභංගත්වයට පත් වී ඇති බව ප්‍රකාශ කර ඇත්තේ නම් හෝ
(ඊ) කාර්යාංශය සමග සෘජු හෝ ව්‍යාංග මූල්‍ය සම්බන්ධතාවයකට කරුණු යෙදී ඇති අයෙකු වේ නම් හෝ
(උ) මෙම ප්‍රඥප්තියේ 9 වන වගන්තිය යටතේ ඉවත් කළ සාමාජිකයෙකු හෝ සාමාජිකත්වය අහෝසි වූ අයෙකු වේ නම් හෝ

එවැනි තැනැත්තෙකු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ කටයුතු කිරීමට නුසුදුස්සෙකු වන්නේ ය.

පත්කළ සාමාජිකයනගේ ධුර කාලය

7. (1) මණ්ඩලයේ පත් කළ සෑම සාමාජිකයකුම, ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට අවුරුදු තුනක් නොඉක්මවන කාලයක්, ධූරය දැරිය හැකිය. තවද, 9 (1) උප වගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට නුසුදුස්සකු නොවිය යුතුය.

(2) පත්කළ සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කරනු ලබන අවස්ථාවකදී හෝ ඉල්ලා අස්වන අවස්ථාවකදී නැවත පත් කරන සාමාජිකයා විසින් ඉතිරිව ඇති ධුර කාලය සඳහා පමණක් ධූරය දැරිය යුතුය.

මණ්ඩලයේ සභාපතිවරයාගේ ධුර කාලය

8. (1) 9(1) වන උප වගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය මණ්ඩලයේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව වන්නේය.

(2) රෝගාතුරවීමකින් හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් හෝ තම ධුර කාර්යය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත් සභාපති ධුරයේ වැඩ බැලීම සඳහා අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු පත් කළ හැකිය.

(3) අමාත්‍යවරයා විසින් සභාපතිවරයාගේ ක්‍රියා කලාපය පිළිබඳ සෑහීමකට පත් නොවන විට සභාපතිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකිය.

(4) මණ්ඩලයේ සියළු රැස්වීම්වලදී සභාපතිවරයා මූලාසනය දූරිය යුතුය. මණ්ඩලයේ යම් රැස්වීමකදී සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින මණ්ඩල සාමාජිකයින් අතරින් එක් සාමාජිකයෙකු රැස්වීමේ මුලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගත යුතුය.

සාමාජිකත්වයෙන් ඉවත් කිරීම

9. (1) අමාත්‍යවරයා විසින් කවර හෝ පත් කළ සාමාජිකයකුගේ ක්‍රියා කලාපය පිළිබඳ සෑහීමකට පත් නොවන විට පත් කළ සාමාජිකයකුගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකිය.

(2) ඉල්ලා අස්වන බවට අමාත්‍යවරයා වෙත යවන ලද ලිපියක් අමාත්‍යවරයා පිළිගත් බව දැනුම් දීමෙන් අනතුරුව මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට, සාමාජිකයකු වශයෙන් වු හෝ සභාපති වශයෙන් වු හෝ ස්වකීය ධුරයෙන් ඕනෑම අවස්ථාවකදී ඉල්ලා අස්විය හැකිය.

(3) අමාත්‍යවරයාගෙන් ලබාගත් විධිමත් අවසරයකින් තොරව අනුගාමී කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර තුනකට සහභාගි නොවන පත්කළ සාමාජිකයෙකුගේ සාමාජිකත්වය අහෝසි වන්නේය.

මණ්ඩලයේ කාර්ය පරිපාටිය

10. (1) මණ්ඩලයේ යම් රැස්වීමක ගණ පූරණය සඳහා සාමාජිකයන් හතරදෙනෙකු සිටිය යුතුය.

(2) මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයන් පත්කිරීම දෝෂ සහිත වීම යන හේතු නිසා මණ්ඩලයේ යම් කිසි ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් බල රහිත නොවිය යුතුය.

(3) මණ්ඩලයේ රැස්වීමක් අවම වශයෙන් මසකට වරක් හෝ පැවැත්විය යුතුය. මණ්ඩලයේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධ කාර්යය පටිපාටි මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට විය යුතුය.

(4) කාර්යාංශයේ සියළුම සාමාජිකයන්ට හෝ සාමාජිකයන්ගෙන් කිසිවෙකුට පළාත් භාණ්ඩාගාරය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා විධිවිධානවලට අනුකූලව පාරිශ්‍රමික, දීමනා හා වෙනත් වියදම් කාර්යාංශයේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය.

(5) කාර්යාංශයේ කටයුතු කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා අවශ්‍ය ස්වකීය බලතල සහ කාර්ය, මණ්ඩලය විසින් සභාපතිවරයාට, අධ්‍යක්ෂවරයාට හෝ කාර්යාංශයේ සේවා නියුක්තිකයෙකුට පවරා දිය හැකිය.

(6) යම් කරුණක් සම්බන්ධයෙන් මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඡන්දය සම ලෙස බෙදීමක් ඇති වුවහොත් එම අදාළ රැස්වීමේ මුලාසනය දරන සාමාජිකයාට තීරක ඡන්දයක් හිමිවිය යුතු ය.

(7) කාර්යාංශයේ සේවා නියුක්තිකයන් අතරින් සුදුසු නිලධාරියෙකු මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් පත් කළ හැකිය.

කාර්යාංශයේ මුද්‍රාව

11. (1) කාර්යාංශය සතු මුද්‍රාව අධ්‍යක්ෂවරයා භාරයේ තිබිය යුතු ය.

(2) කාර්යාංශයේ මුද්‍රාව මණ්ඩලය තීරණය කරනු ලබන ආකාරයකට විය යුතු ය.

(3) සභාපතිවරයා හා මණ්ඩලයේ සාමාජිකයකු ඉදිරිපිටදී හැර කිසිම සාධන පත්‍රයකට, ගිවිස්නාවකට හෝ ලියවිල්ලකට කාර්යාංශයේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට, ගිවිස්නාවකට හෝ ලේඛනයට තම අත්සන තැබිය යුතු ය.

(4) කාර්යාංශයේ පොදු මුද්‍රා තබන ලේඛන හා ලියකියවිලි පිළිබඳව ලේඛනයක් කාර්යාංශය විසින් එය ආරම්භ කරන දින සිටම පවත්වාගෙන යා යුතු ය.

12. කාර්යාංශයේ අරමුණු ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් කාර්යාංශයට ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතු ය. කාර්යාංශය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල

### *IV* වන කොටස

### කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරී හා වෙනත් කාර්ය මණ්ඩලය

13. (1) කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් මෙහි මින්මතු අධ්‍යක්ෂවරයා වශයෙන් හඳුන්වන, ඊට අදාළ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගනු ලබන පූර්ණකාලීන තැනැත්තෙකු විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කළ යුතු ය. කාර්යාංශයේ ප්‍රධාන විධායක නිලධාරියා

එසේ වුවද විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් කාර්යාංශය අධ්‍යක්ෂ තනතුර සඳහා බලාත්මක වී නොමැති තාක් අධ්‍යක්ෂවරයා වශයෙන් සුදුසු අයෙකු ප්‍රධාන ලේකම්ගේ එකඟතාවය මත විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කළ යුතු ය.

(2) කාර්යාංශයේ කටයුතු අධීක්ෂණය කිරීම කාර්යාංශයේ බලතල කටයුතු හා කාර්යයන් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ කාර්යාංශයේ සේවා නියුක්තිකයන්ගේ පරිපාලනය, මණ්ඩලයේ සාමාන්‍ය විධිවිධානයට සහ පාලනයට යටත්ව අධ්‍යක්ෂවරයා වෙත පැවරේ.

(3) ස්වකීය කර්තව්‍යය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍යයයි කාර්යාංශය සලකනු ලබන සෙසු නිලධරයන් සහ සේවකයන් අනුමත බඳවා ගැනීමේ පරිපාටියට යටත්ව මණ්ඩලය විසින් අනුමත කරනු ලැබීමෙන් අනතුරුව සභාපතිවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(4) බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්ත යම් නිලධාරියෙකු මණ්ඩලයේ ඉල්ලීම පිට ඒ නිලධාරියාගේ සහ එම නිලධාරියාගේ සේවා නියුක්ත පළාත් විෂයභාර අමාත්‍යාංශ ලේකම්ගේ කැමැත්ත ඇතිව ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත මණ්ඩලය නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකිය.

### *V* කොටස

### කාර්යාංශයේ අරමුදල

14. කාර්යාංශය නමින් අරමුදලක් තිබිය යුතු ය. එම අරමුදලට, කාර්යාංශයේ අරමුදල

(අ) ප්‍රධාන වශයෙන් පළාත් සභාව විසින් කාර්යාංශයට විසර්ජනය කරන ලද මුදල්,

(ආ) මේ ප්‍රඥප්තිය යටතේ ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සම්බන්ධයෙන් අය කරනු ලබන සියළු මුදල්,

(ඇ) ගාස්තු හා අය කිරීම් වශයෙන් කාර්යාංශය විසින් භාර ගන්නා ලද සියළු මුදල්,

(ඈ) ශ්‍රී ලංකාවෙන් හෝ ඉන් පිටත හෝ කවර හෝ ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන හෝ වෙනත් ආකාරයකින් ලැබෙන සියළු මුදල්,

(ඉ) කාර්යාංශය සතු දේපළ, වත්කම්, භාණ්ඩ හා උපකරණ විකිණීමෙන්, කුලියට දීමෙන්, බදු දීමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබෙන සියළු මුදල්,

(ඊ) යම් විශේෂ ව්‍යාපෘති ඉටු කිරීම හෝ යම් කාර්යයන් ඉටු කිරීම සඳහා හෝ පළාත් සභා අරමුදලින් හෝ පළාත් පාලන ආයතන වලින් හෝ වෙනත් යම් ආයතනයකින් ලැබෙන මුදල්,

(උ) කාර්යාංශය සතු මුදල් ආයෝජනය කිරීමෙන් හෝ තැන්පත් කිරීමෙන්, ලාභය, වාරික හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල්,

(ඌ) වෙනත් කවර හෝ නීත්‍යානුකූල ප්‍රභවයකින් කාර්යාංශයට ලැබෙන මුදල්, බැරවිය යුතු ය.

අරමුදලින් ගෙවීම.

15. අරමුදලින් පහත කරුණු සඳහා ගෙවීම් කළ හැකිය.

(අ) කාර්යාංශයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ට ගෙවිය යුතු පාරිශ්‍රමික,

(ආ) කාර්යාංශයේ නිලධාරීන්ට, සේවකයින්ට සහ සේවා නියුක්තිකයින්ට ගෙවිය යුතු වැටුප් හා වෙනත් දීමනා

(ඇ) කාර්යාංශයට භාණ්ඩ හා සේවා සපයන්නන්ට ගෙවිය යුතු ගෙවීම් හා පාරිශ්‍රමික,

(ඈ) කාර්යාංශය විසින්, මේ ප්‍රඥප්තිය යටතේ බලතල, ක්‍රියාත්මක කිරීමේ දී හෝ තම කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් දරන ලද සියළු වියදම්

මුදල් වර්ෂය

16. කාර්යාංශයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය වන්නේ ය.

කාර්යාංශයේ ගිණුම්

17. කාර්යාංශයේ ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද ගිණුම් හා පොත් පත් පවත්වා ගෙන යා යුතු ය. කාර්යාංශයේ ගිණුම් පවත්වා ගෙන යාම මෙම ප්‍රඥප්තිය යටතේ සාදනු ලබන රීති මගින් නියම කරනු ලබන ආකාරයට විය යුත්තේ ය.

18. කාර්යාංශයේ අරමුදලේ මුදල් විගණනය සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 ව්‍යවස්ථාව අදාළ වන්නේ ය.

## *VI* කොටස

### පොදු කරුණු

රීති

19. (1) මෙම ප්‍රඥප්තිය යටතේ සඳහන් කරුණු සම්බන්ධයෙන් හා ප්‍රඥප්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට හා ගාස්තු අය කිරීමට අදාළ සියළුම කරුණු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ පැවරෙන බලතලවලට හානියක් නොමැතිව රීති සෑදීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) මෙම වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර, එසේ පළකරනු ලැබූ දින හෝ ඒ රීතියේ සඳහන් යම් දිනක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක්ම, එය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතු ය. එසේ පළාත් සභාව විසින් අනුමත නොකරන ලද යම් රීතියක් එසේ අනුමත නොකිරීමට ගත් තීරණයේ දින පටන් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද යම් කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

## *VII* වන කොටස

## අන්තර්කාලීන විධිවිධාන

20. (1) මෙම ප්‍රඥප්තියට බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ. අන්තර්කාලීන විධිවිධාන

(2) එසේ වුවද 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය සතුව තිබූ :-

(අ) සියලු චංචල හා නිශ්චල දේපළ ;

(ආ) සියලු වත්කම් හා බැරකම් ;

(ඇ) සියලු වගකීම් හා බැඳීම් ;

මෙම ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය සතු චංචල හා නිශ්චල දේපල, වත්කම් හා බැරකම්, වගකීම් හා බැඳීම් වශයෙන් සැලකිය යුතු ය.

(3) 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් මෙම ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් ලෙස සැලකිය යුතු ය.

(4) 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රඥප්තිය යටතේ කාර්යාංශය විසින් හෝ කාර්යාංශයට එරෙහිව පවරන ලද සෑම නඩුවක්ම මෙම ප්‍රඥප්තිය යටතේ පවරනු ලැබූවක් සේ සැලකිය යුතු ය.

(5) 2010 අංක 09 දරන ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශය ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ ආර්ථික ප්‍රවර්ධන කාර්යාංශයේ නිලධරයන් හෝ සේවකයන් මෙම ප්‍රඥප්තිය යටතේ වූ කාර්යාංශයේ නිලධරයන් හෝ සේවකයන් වශයෙන් සැලකිය යුතු ය.

21. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථ නිරූපණය සහ කාර්යයන් උදෙසා මණ්ඩලයේ සියලුම සාමාජිකයන් හා කාර්යාංශයේ නිලධාරීන් සහ සේවකයින් රාජ්‍ය සේවකයින් වශයෙන් සලකනු ලැබිය යුතු අතර අල්ලස් පනතේ කාර්යයන් සඳහා කාර්යාංශය උපලේඛනගත ආයතනයක් වශයෙන් සැලකිය යුතු ය. කාර්යාංශයේ නිලධාරීන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රාජ්‍ය නිලධාරීන් වශයෙන් සැලකිය යුතු බව

22. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස අර්ථ නිරූපණය

''පළාත'' යන්නෙන් බස්නාහිර පළාත ද,

''පළාත් සභාව'' යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව ද,

''අමාත්‍යවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ අමාත්‍ය මණ්ඩලයේ මුදල් විෂයභාර අමාත්‍යවරයා ද,

''ප්‍රධාන ලේකම්'' යන්නෙන් බස්නාහිර පළාතේ ප්‍රධාන ලේකම්වරයා ද, අදහස් වන්නේ ය.

23. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය. අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

05 - 907

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.